Good Food, Good Life

Nestlé Lanka PLC News Release
Colombo: 27 February 2017

**නෙස්ලේ මයිලෝ ශ්‍රී ලාංකීය සිසුන්ගේ වැඩිම මනාපයෙන් 'වසරේ ශිෂ්‍යයන්ගේ පානය" වෙයි.**

ශ්‍රී ලංකා ක්‍රිකට් නායක ඇන්ජලෝ මැතිව්ස් විසින් අනුමත කර ඇති මයිලෝ සන්නාමය, ශ්‍රී ලාංකීය සිසු පරපුරේ වැඩිම මනාපය හිමිකරගනිමින් 'වසරේ ශිෂ්‍යයන්ගේ පානය" යන සම්මානයෙන් නැවත වරක් 2016 දී පිදුම් ලබා තිබේ. මෙම සම්මානය, මයිලෝ විසින් දිනාගන්නා ලද තුන් වැනි අවස්ථාව වන අතර ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් මයිලෝ කෙරෙහි තබා තිබෙන උපරිම විශ්වාසය කොතරම්ද යන වග ඉන් පැහැදිලි වේ.

කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ඩී. එස් ශිෂ්‍ය සන්නාම සම්මාන උළෙලේදී මයිලෝ වෙත මෙම සම්මානය පිරිනැමූ අතර, ඒ සඳහා බස්නාහිර පළාතේ පාසල් සිසු සිසුවියන් 9,000කට ආසන්න සංඛ්‍යාවකගේ අදහස් සමීක්ෂණයට ලක් කර තිබුණි.

"පෝෂණය සහ ශක්තිය සැපයීම ප්‍රමුඛතම සන්නාමීය පොරොන්දුව බවට පත්කරගනිමින් කටයුතු කරන මයිලෝ, දරුවන්ට ඔවුන්ගේ හැකියාවලින් උපරිම ඵල ලබාගැනීමට අනුබල දිය යුතු බව දැඩිව විශ්වාස කරනවා. පාසල් ක්‍රීඩා තරග ඉසව් සඳහා මයිලෝ ඉතාමත් කැපවීමෙන් අනුග්‍රාහකත්වය ලබා දීමට ඉදිරිපත් වී තිබෙනවා. ඒ හරහා සිසු සිසුවියන්ගේ හැකියාවන් දේශීයව පමණක් නොවෙයි ජාත්‍යන්තරවද ඇගයීමට ලක් කිරීම සඳහා අවස්ථාව ලබා දී තිබෙනවා. අති විශාල සිසු පිරිසකගේ මනාපය හිමිකර ගනිමින් පිළිවෙළින් තුන් වැනි වර්ෂයටත් 'වසරේ ශිෂ්‍යයන්ගේ පානය" සම්මානය දිනාගැනීමට හැකිවීම විශාල භාග්‍යයක් ලෙස අප සලකනවා. ළමා පරපුර වෙත පෝෂණය, ශක්තිය සහ ඔවුන්ගේ විශිෂ්ට හැකියාවන් ඔපමට්ටම් කර ගැනීම සඳහා අවශ්‍ය අනුබලය ලබා දෙමින් මයිලෝ සන්නාමය සිදු කරන නොනවතින මෙහෙවර විශිෂ්ට ලෙස ඇගයීමට ලක් කරන ලද අවස්ථාවක් ලෙසයි අප මෙය දකින්නේ. ආහාර පාන නිෂ්පාදන ක්‍රියාවලියෙහි නිරත, ලොව ඕනෑම සමාගමක් අතුරින් විශාලතම සමීක්ෂණ සහ සංවර්ධන (R&D) ජාලය හිමි නෙස්ලේ සමාගමේ ජාත්‍යන්තර තාක්ෂණික ප්‍රවීණත්වය සහ මයිලෝ සන්නාමය කෙරෙහි පාරිභෝගිකයින් සතු විශ්වාසය සහ බැඳීම කොතරම් දැයි මෙම අගය කිරීම හරහා පැහැදිලි වෙනවා" යනුවෙන් මෙම ජයග්‍රහණය පිළිබඳව අදහස් දක්වමින් නෙස්ලේ ලංකා සමාගමේ නියෝජ්‍ය සභාපති - පානීය නිෂ්පාදන, නෝමන් කන්නන්ගර මහතා පවසා සිටියේය.

ආහාර සුරක්ෂිතතාවය සහ ප්‍රමිතිය සඳහා නෙස්ලේ සමාගම සැම විටම අංක එකේ ප්‍රමුඛත්වය ලබා දෙයි. මයිලෝ RTD (Ready-To-Drink) නිපදවීම සඳහා UHT (Ultra-high temperature) ක්‍රියාවලියක් අනුගමනය කරන අතර එමගින් පාරිභෝගිකයා වෙත කිරිවල අන්තර්ගත උපරිම පෝෂණ ප්‍රතිලාභය ලබා දීම සිදු වේ. නිෂ්පාදන සහ ගබඩා කිරීම් ක්‍රියාවලිය තුළ සැම අදියරකදීම නිෂ්පාදන සනීපාරක්ෂාව, ආහාර සුරක්ෂිතතාවය සහ ප්‍රමිති පරීක්ෂාවන් නෙස්ලේ සමාගම සිදු කරන අතර අභ්‍යන්තර පර්යේෂණාගාර තුළ මෙන්ම භාහිර පර්යේෂණාගාරයන් තුළද එම කටයුතු සිදු කෙරේ. පාරිභෝගිකයා අතට සුරක්ෂිත ඉහළ ප්‍රමිතිගත නිෂ්පාදනයක් ලබා දීම එහි ප්‍රධානතම අරමුණයි.

ශ්‍රී ලාංකික කිරි ගොවීන් 21,000 කට ආසන්න සංඛ්‍යාවකගෙන් දෛනිකව මිලදී ගන්නා නැවුම් කිරි යොදාගනිමින් නිපදවන මයිලෝ RTD පානය මෝල්ට් යහගුණයෙන් පරිපූර්ණ වන අතර එහි අඩංගු හොඳම කොකෝවා භාවිතය මගින් චොකලට් මෝල්ට් රසයක් පාරිභෝගිකයා වෙත ලබා දෙයි. නිෂ්පාදන ක්‍රියාවලියෙහි ඉහළ ගුණාත්මකභාවය සම්බන්ධව ලොව පුරා සුවිසල් කීර්තියක් දිනා සිටින නෙස්ලේ ලංකා සමාගමේ කුරුණෑගල පිහිටි අතිනවීන පහසුකම් සපිරි කර්මාන්තශාලවේදී මයිලෝ නිෂ්පාදනය කරනු ලබයි.